ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
ලංකා විදුලිබල මණ්ඩලය

**ජාත්‍යන්තර මට්ටමින් තරගකාරී ලංසු කැඳවීම (ICB)**

**මෙගා වොට් 60ක (1-10 මෙගාවොට් ප්‍රමාණයේ) සුළං විදුලි බලාගාර ස්ථාපනය කිරීම සඳහා ඉදිකිරීම, අයිතිය සහ පවත්වා ගෙන යාම (Build, Own and Operate) යන පදනම මත යෝජනා කැඳවීම**

අංකය - TR/RED&PM/ICB/2019/002/C

**යෝජනා භාර ගැනීමේ අවසන් දිනය සහ වේලාව - 2020 පෙබරවාරි මස 26 වන දින පෙ.ව. 10.00**

1. සුළං බල උත්පාදනය මගින් ජාතික විදුලිබල පද්ධතිය වෙත විදුලිය සැපයීම සඳහා ව්‍යාපෘතිය ඉදිකිරීම් අයිතිය සහ පවත්වාගෙන යාම යන පදනම මත පිළිගත් ව්‍යාපෘති යෝජකයන් වෙතින් මෙ.වො. 60ක ධාරිතාවයකට පහත සඳහන් ග්‍රිඩ් උපපොළවල් සඳහා යෝජනා ලංකා විදුලිබල මණ්ඩලය මගින් කැඳවනු ලැබේ. **එක් බලාගාරයක ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 1 සිට 10 දක්වා වේ.**

| | ග්‍රිඩ් උපපොළ | උපරිම ධාරිතාවය |
|---|---|---|
| 1 | මන්නාරම* | 15MW |
| 2 | බෝලවත්ත | 10MW |
| 3 | මාදම්පේ | 10 MW |
| 4 | කප්පල්තුරෙයි* | 15MW |
| 5 | ත්‍රිකුණාමලය | 10MW |
| | **එකතුව** | **60MW** |

සටහන : * මන්නාරම සහ කප්පල්තුරෙයි ග්‍රිඩ් උපපොලවල් දැනට තැනීම් කටයුතු කරමින් පවතින අතර අපේක්ෂිත තැනීම් අවසන් කරනු ලබන දිනයන් වනුයේ පිළිවෙලින් 2020 ජනවාරි සහ 2020 ජුනි මාස වලදීය.

2. යෝජනා ඉදිරිපත් කරන ව්‍යාපෘති යෝජකයන් විසින් පහත සඳහන් අවශ්‍යතාවයන් ඉටු කල යුතුය.

   අ) ව්‍යාපෘතියේ සැලසුම් සම්පාදනය, මූල්‍ය කටයුතු, මිලදී ගැනීම්, ඉදිකිරීම්, මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කල යුතුය.
   
   ආ) ව්‍යාපෘතියෙහි අවශ්‍යතාවය පරිදි අවශ්‍ය ඉඩම් මිලදී ගැනීම හෝ කල්බදු ක්‍රමයට ලබා ගැනීම කල යුතුය.
   
   ඇ) සුළං බලාගාරය අදාල ග්‍රිඩ් උපපොල වෙත සම්බන්ධ කිරීම සඳහා අවශ්‍ය ඊ.හැන් මග, තරාපැවි, විදුලි ආරක්ෂණ පද්ධති, විදුලි මණු ආදිය සඳහා වන සියළු වියදම් දැරිය යුතුය.
   
   ඈ) ව්‍යාපෘතියට අදාලව අවශ්‍ය වන සියළු පාරිසරික අනුමැතීන්, රාජ්‍ය ආයතන වල අනුමැතීන් හා ව්‍යවස්ථාපිත බලපත්‍ර ආදිය ලබා ගත යුතුය.
   
   ඉ) එම සුළං බලාගාරය සඳහා ලං.වි.ම. සමග බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කල යුතු අතර විදුලිය මිලදී ගැනීම සඳහා එම ගිවිසුම වාණිජ මෙහෙයුම් ආරම්භ කරන දිනයේ සිට වසර 20 ක කාලයක් සඳහා වලංගු වේ. අදාල ග්‍රිඩ් උපපොළට මුදාහරින විදුලි බලශක්ති ප්‍රමාණය (Energy) මත පමණක් පදනම්ව විදුලි මිලදී ගැනීම් සිදු කෙරේ.

3. එක් ව්‍යාපෘති යෝජකයකුට ඉහත සඳහන් ග්‍රිඩ් උප පොළයන්හි බලාගාර ඕනෑම ප්‍රමාණයක් සඳහා ග්‍රිඩ් උප පොළ උපරිම ධාරිතාව නොඉක්මවන කොන්දේසියට යටත්ව යෝජනා ඉදිරිපත් කල හැකි අතර සෑම යෝජනාවක් සඳහාම වෙන වෙනම යෝජනා කැඳවීම් ලේඛන (Request for Proposal Document) මිලදී ගත යුතුය. ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් සමග පහත ලිපිනයෙහි පිහිටා ඇති නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුන.බ.සං. හා කා.අ.) ශාඛාව වෙත පැමිණ නැවත නොගෙවන රු.100,000/- ක ගාස්තුවක් මුදලින් හෝ '**සාමාන්‍යාධිකාරී - ලංකා විදුලිබල මණ්ඩලය**' නමට ලියන ලද බැංකු අණකරයක් මගින් ගෙවීමෙන් වැඩ කරන දිනවල පෙ.ව. 09.00 සිට ප.ව. 02.00 දක්වා කාලය තුල ලබා ගත හැක.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුන.බ.සං. හා කා.අ.) ශාඛාව,
ලංකා විදුලිබල මණ්ඩලය,
නො. 6-1/2, පළමු මහල,
සුලෙයිමාන් ඇවනියු හරහා,
කාලිංග පෙදෙස,
කොළඹ 00500

දු.ක. +94 11 2583344 / 2504203 දු.ලි. +94 11 2583344

යෝජනා කැඳවීම් ලේඛන (Request for Proposal Document) 2020 පෙබරවාරි මස 25 දින පෙ.ව. 10.00 දක්වා ලබා ගත හැකිය.

මෙම ලියකියවිලි ලං.වි.ම. වෙබ් අඩවියෙන්ද (http://www.ceb.lk/tenders) පරීක්ෂා කළ හැක.

4. යෝජනා කැඳවීමේ ලේඛන පිළිබඳ සියළු විමසීම් ඉහත ලිපිනයෙහි සඳහන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුන.බ.සං. හා කා.අ.) වෙතින් සිදු කළ හැක. යෝජනා කැඳවීමේ ලේඛන ඉල්ලා ලිඛිත ඉල්ලීමක් ඉහත ලිපිනය වෙත යොමු කිරීම මගින් ඒවා ශීඝ්‍රගාමී බෙදාහැරීම් සේවය (Courier Service) මගින් ගෙන්වා ගත හැක. ඒ සඳහා ලිඛිත ඉල්ලීම සමග නැවත නොගෙවන, '**සාමාන්‍යාධිකාරී - ලංකා විදුලිබල මණ්ඩලය**' නමට ලියන ලද රු.100,000/- ක (දේශීය බෙදාහැරීම් සඳහා) හෝ ඇමෙරිකානු ඩොලර් 700 ක (විදේශීය බෙදාහැරීම් සඳහා) බැංකු අණකරයක්, 2020 පෙබරවාරි 25 දින පෙ.ව. 10.00 ට පෙර එවිය යුතුය. බෙදා හැරීමේදී සිදුවන ප්‍රමාද වීම් හෝ අස්ථානගතවීම් සම්බන්ධයෙන් ලං.වි.ම. වග කියනු නොලැබේ.

5. යෝජනා කැඳවීමේ ලේඛනයෙහි උපදෙස් හා කොන්දේසි වලට අනුකූලව සකස් කර ගන්නා ලද සියළුම යෝජනා 2020 පෙබරවාරි මස 25 වන දින දක්වා පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 කාලය තුල ඉහත ලිපිනයෙහි සඳහන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුන.බ.සං. හා කා.අ.) කාර්යාලය වෙත හෝ 2020 පෙබරවාරි මස 26 වන දින පෙ.ව. 10.00 ට පෙර පහත සඳහන් ලිපිනය වෙත භාර දිය යුතුය.

සභාපති (අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව)
ලංකා විදුලිබල මණ්ඩලය,
කලාපීය ආලෝකකරණ මධ්‍යස්ථානය (RCL),
දෙවන මහල,
5 වන පර්යන්තය, BMICH,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 00700,
ශ්‍රී ලංකාව.

2020 පෙබරවාරි මස 26 වන දින පෙ.ව. 10.00 ට පසු භාරදෙන යෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

යෝජනා භාර ගැනීමේ දිනය සහ වේලාව පසු වූ විගස භාරදෙන ලද යෝජනා ව්‍යාපෘති යෝජකයින් හෝ බලයලත් නියෝජිතයන් ඉදිරියේ විවෘත කරනු ලැබේ.

සභාපති,
අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

50 සංවත්සරය
ஆண்டுவிழா
ANNIVERSARY
1969 - 2019